ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ඉන්දීය මහ කොමසාරිස්තුමා යාපනයේ කයිට්ස්, නයිනතිවු සහ අනලතිවු හි ධීවර ප්‍රජාව සඳහා සහන ලබා දෙයි

2026 ජූනි 3 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා යාපනයේ කයිට්ස්, නයිනතිවු සහ අනලතිවු හි ධීවර ප්‍රජාව සඳහා උසස් තත්ත්වයේ ධීවර දැල් බෙදා දුන්නේය.

2. මෙම අවස්ථාව ඇමතූ මහ කොමසාරිස්තුමා විශේෂයෙන්ම ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාව අතර ගැඹුරු ඓතිහාසික සහ සංස්කෘතික සබඳතා පවතින බව සඳහන් කළේය. එතුමා අසල්වැසියා ප්‍රථමයෙන් යන ප්‍රතිපත්තිය යටතේ ජනතා කේන්ද්‍රීය සංවර්ධන සහයෝගීතාවය උදෙසා ඉන්දියවේ කැපවීම ද අවධාරණය කළේය. මහ කොමසාරිස්තුමා ධීවරයන්ගේ ඔරොත්තු දීමේ හැකියාව, කැපවීම සහ ප්‍රජාව උදෙසා ලබා දෙන මාහැඟි දායකත්වයන් අගය කළේය. පේදුරු තුඩුව වරාය සංවර්ධනය කිරීම, කරයිනගර් බෝට්ටු අංගනය, උතුරු පළාතේ ධීවර කටයුතු සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානය, ධීවරයන් සඳහා පුහුණු අවස්ථා සහ ධීවර දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා යතුරු පැදි ලබා දීම ඇතුළු ධීවර ප්‍රජාවගේ යහපත උදෙසා ඉන්දීය රජය විසින් ගෙන ඇති විවිධ සංවර්ධන සහන මුලපිරීම් පිළිබඳව ද මහ කොමසාරිස්තුමා මෙහිදී සිහිපත් කළේය.

3. මෙම අවස්ථාවේදී බෙදා දෙන ලද උසස් තත්ත්වයේ ධීවර දැල් යාපනයේ ගුරුනගර් ධීවර දැල් කර්මාන්ත ශාලාවෙන් ලබා ගන්නා ලදී. මෙම කර්මාන්ත ශාලාව 2013 වසරේදී ශ්‍රී ලංකා රුපියල් මිලියන 166ක ඉන්දීය ප්‍රදානයක් යටතේ යන්ත්‍රෝපකරණ සහ උපකරණ සමඟින් නවීකරණය කරන ලදී. ඒ අනුව කර්මාන්ත ශාලාවේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 60 සිට මෙට්‍රික් ටොන් 300 දක්වා ඉහළ නැංවිය හැකි විය. එබැවින්, මෙම ධීවර දැල් ලබා දීම තුළින් සෘජුවම ධීවරයන්ට ප්‍රතිලාභ සැලසීමට අමතරව දේශීය ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම තුළින් ප්‍රදේශයේ ආර්ථිකයට ද දායකත්වය ලබා දෙන ලදී.

****

**කොළඹ**

***2026*** *ජූනි* ***08***